**ශීර්ෂය 415 - ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

------------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් යටතේ රු.2,005,173ක් දක්වා තිබුණද ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු.8,893,730ක් වුයෙන් රු.6,888,557ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනත් ශීර්ෂයන් වෙනුවෙන් එකතු කරන ලබන ආදායමක් වන හෙයින් එය මූල්‍ය ප්‍රකාශන වල සටහන් නොකරන ලදි. එය හරස් සටහන් මගින් ලද ලැබීම් ලෙස ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශවල දැක්වීම සඳහා සටහන් කර ගන්නා ලදි. | ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම් මුළු වටිනාකම විධිවිධාන ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ දැක්විය යුතුවීම. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ACA - 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් අපහරණ යටතේ විකිණීම මගින් රු.3,219,744 සහ මාරු කිරීම් මගින් රු.13,953,482ක් ලෙස රු.17,173,226ක් ඇතුළත් කර තිබුණත් අපහරණයේ මුළු වටිනාකම වශයෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දක්වා ඇති අගය රු.16,798,976ක් වුයෙන් රු.374,250ක වෙනසක් නිරීක්ෂණය විය. | 374,250 යනු 2020 වර්ෂය තුල මිලදී ගත් යන්ත්‍ර හා උපකරණ වලට අදාල වටිනාකම වන අතර එය අපහරණයට අයත් නොවේ. ඒ අනුව ACA- 6 ආකෘතියේ අක්වා ඇති අපහරණ වටිනාකම වන රු.16,798,976 යන අගය නිවැරදි වේ. | වත්කම් අපහරණ යටතේ විකිණීම මගින් හා මාරු කිරීම් මගින් දැක්විය යුතු අගයන් නිවැරදිව දැක්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඒසීඒ - 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව කේත අංක 6112202 යටතේ වර්ෂය තුළ පරිගණක උපකරණ මිලදී ගැනීම් ලෙස රු.300,000ක් දක්වා තිබුණ ද භාණ්ඩාගාර මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි **SA** 82 හි මෙම මිලදී ගැනීම ඇතුළත් කර නොතිබුණි. | මෙය **2020** වර්ෂය තුළ සිදුවූ ශීර්ෂ මාරුව හරහා වත්කම් පැවරීම් හා අත්පත් කර ගැනීමේදී එය CIGAS වැඩ සටහන සමග ගැලපීමට නොහැකි තාක්ෂණික ගැටළුවක් මත පැන නැගුන වෙනසක් වේ. | 415 ශීර්ෂයට අයත් වත්කම් මිලදී ගැනීම් පමණක් සටහන් කළ යුතු වේ. |
| (ඇ) | ඒසීඒ - 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි අපහරණයන්හි මුළු වටිනාකම රු.17,173,226ක් වන අතර භාණ්ඩාගාර මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි **SA** 82 හි එම අගය රු.16,873,226 වුයෙන් රු.300,000ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය **2020** වර්ෂය තුළ සිදුවූ ශීර්ෂ මාරුව හරහා වත්කම් පැවරීම් හා අත්පත් කර ගැනීමේදී එය CIGAS වැඩ සටහන සමග ගැලපීමට නොහැකි තාක්ෂණික ගැටළුවක් මත පැන නැගුන වෙනසක් වේ. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණයන් නිවැරදි වටිනාකම දැක්විය යුතු වීම. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**(අ) පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් මුදල් වැය කිරීම සහ අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම අනුව මුදල් වැයකිරීම් අතර රු.1,140,650,728ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණන විමසුමේ ශේෂ පිරික්සුමේ අගයන් ලෙස දක්වා ඇත්තේ අවසන් මාස 4 ට අදාල අගයන් වන අතර එම අගයට මුල් මාස 8 හි අගයන්ද එකතු කල යුතුය. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ මාස 12 ටම අදාලව අගයන් යොදා ගෙනය. | අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියල කල යුතු වීම. |

(ආ) ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශ ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වූ රු.8,893,730ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ සත්‍ය වශයෙන් මුදල් ලැබීම් හා ගෙවීම් පාදක කොට ගෙනය. ඒ අනුව වෙනත් ශීර්ෂ වලින් එකතු කරන ලද ආදායම ලෙස විගණන විමසුමෙහි දක්වා ඇති රු.8,893,730 ක මුදල හරස් සටහන් මගින් ලැබීම් වන අතර එය මුදල් පොතේ ශේෂයට හෝ අග්‍රිම ගිණුම් ශේෂයට හෝ කිසිදු ආකාරයකට බලපෑම් නොකරනු ලබයි. | මුදල් හා මුදල්වලට සමාන සියලු ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගත යුතු වේ. |

(ඇ) වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.4,169,941,425ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.5,869,105,165 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,699,163,740 ක වෙනසක් නිරීක්ෂණය විය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අවසන් මාස 4 තුළ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 411 ශීර්ෂයට ලබා දී තිබූ වැය විෂයන් 05 ක් මූ.රෙ.208 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් ලෙස අප අමාත්‍යාංශයට ලබා දෙන ලදි. අතුරු සම්මත ගිණුම් 3 හි 123 ශීර්ෂය යටතේ ඉහත සඳහන් කරන ලද වැය විෂයන් පැවතියද 2020 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය වාර්තාවේ එම වැය විෂයන් දක්වා ඇත්තේ 411 ශීර්ෂය යටතේය. ඒ අනුව ජනවාරි සිට අගෝස්තු දක්වා ඉහතින් සඳහන් කල වැය විෂයන් වලට අදාලව 397/20 අග්‍රිම ගිණුම යටතේ දරන ලද සියළු වියදම් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කර ඇත. ඒ අනුව ගැලපුම් ගිණුමෙහි දක්වා ඇති රු . 5,869,105,165 යන අගය නිවැරදි වේ. | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්වල නිවැරදි වටිනාකම දැක්විය යුතු වේ. |

## 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

**විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

**(අ)**

විගණන නිරීක්ෂණය: අත්තිකාරම් ගිණුමෙහි වාර්ෂික සැසඳුම් ප්‍රකාශයෙහි මු.රෙ. 503(1) යටතේ ගැළපුම් ඉවත් කළ තථ්‍ය අගයන් යටතේ හරස් සටහන් මගින් (12) වර්ෂ තුළ හර කිරීම් ලෙස රු.43,330,777 ක් දක්වා තිබුණ ද දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමග සැසඳුම් ප්‍රකාශය (මු.රෙ. 427(1)) යටතේ වටිනාකම රු.43,446,693 ක් බැවින් රු.115,916 ක වෙනසක් නිරීක්ෂණය විය.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම: නැවත පදිංචි කිරීමේ අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස ස්ථාන මාරුවීමක් ලැබ රාජකාරියට වාර්තා කළ අතර එබැවින් ඔහුගේ ණය ශේෂය දෙපාර්තමේන්තු පොත්වලට පමණක් ගැනීම තුළින් මෙම වෙනස සිදුවී ඇති බව කාරුණිකව දන්වමි.

නිර්දේශය: වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේත් දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමග සැසඳුම් ප්‍රකාශයේත් හරස් සටහන් (12) මගින් වර්ෂය තුළ හර කිරීම් සමාන විය යුතු වේ.

**(ආ)**

විගණන නිරීක්ෂණය: දෙපාර්තමේන්තු පාලන ගිණුම් සාරාංශය අනුව වර්ෂයේ මුළු හර කිරීම් සහ බැර කිරීම් වටිනාකමත්, වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව වටිනාකමත්, අත්තිකාරම් ගිණුම වටිනාකමත් අතර පහත පරිදි වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | පාලන ගිණුම් සාරාංශය අනුව රු. | සැසඳුම් ප්‍රකාශය අනුව රු. | අත්තිකාරම් ගිණුම අනුව රු. |
|---|---|---|---|
| වර්ෂයේ හර කිරීම් | 46,903,272 | 45,849,409 | 45,965,324 |
| වර්ෂයේ බැර කිරීම් | 55,680,864 | 9,574,219 | 11,279,774 |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම: 2020.12.31 දිනට පාලන ගිණුම් සාරාංශය මාස 12 සඳහා සකස් කර ඇති අතර විගණන විමසුමේ දක්වා ඇති සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය මාස 04ක් සඳහාවේ. සැසඳුම් ප්‍රකාශය අනුව වෙනස ඊට හේතු වේ.

නිර්දේශය: දෙපාර්තමේන්තු පාලන ගිණුම් සාරාංශය අනුවත්, වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුවත්, අත්තිකාරම් ගිණුම් අනුවත් වර්ෂයේ මුදල් හර කිරීම් හා බැරකම් සමාන අගයන් විය යුතු වීම.

**(ඇ)**

විගණන නිරීක්ෂණය: වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.36,275,190ක් වුවද, දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමග සැසඳුම් ප්‍රකාශය (මු.රෙ. 427(1)) අනුව එම ශේෂය රු.36,391,105ක් වන අතර අත්තිකාරම් ගිණුම අනුව එම ශේෂය රු.34,685,928ක් විය.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම: මෙම වෙනස අභ්‍යන්තර නිලධාරියෙක්ගේ ස්ථාන මාරුවීමක් නිසා සිදු වී ඇති අතර නැවත පදිංචි කිරීමේ අංශය හා ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා

නිර්දේශය: වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයත්, දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාරික

| | | |
|---|---|---|
| | ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත, ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එකම ශීර්ෂයක් යටතේ ක්‍රියාත්මක වන බැවින් අභ්‍යන්තර පොත්පත් වල රු.115,915 වූ මෙම වෙනස සංශෝධනය කර ඇත. | පරිගණක මුද්‍රිත සමග සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයත්, අත්තිකාරම් ගිණුම අනුව ශේෂයත් සමාන අගයක් විය යුතු වේ. |
| (ඇ) වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලට නිරවුල් කළ යුතු රු.1,705,177ක ණය ශේෂයක් වැරදි ලෙස ගිණුම්වල ලැබිය යුතු ණය ශේෂයන් ලෙස සටහන් කිරීම නිසා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වර්ෂය අවසානයේ අත්තිකාරම් ගිණුමෙහි ශේෂයට වඩා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.1,705,177 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකම වර්ෂයක් තුළ ශීර්ෂයන් දෙකක් යටතේ ගිණුම් කටයුතු කිරීමෙන් හර කළ යුතු රු.1,705,177ක මුදල අත්වැරදීමකින් බැර කර ඇත. | ණය ශේෂයන් නිවැරදිව ගිණුම්වල සටහන් කළ යුතු වීම. |

1.6.5 **තැන්පතු**

---------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ ශේෂ පිරික්සුමෙහි තැන්පතු ලැබීම් වටිනාකම රු.133,352,935ක් හා ගෙවීම් වටිනාකම රු.142,506,835ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් ඒවා රු.135,373,305ක් හා රු.139,604,524ක් ලෙස දක්වා තිබීමෙන් ලැබීම් රු.2,020,370ක් වැඩියෙන් ද ගෙවීම රු.2,902,311ක් අඩුවෙන් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත්තේ මුදලින් සිදුවී ඇති තැන්පත් ලැබීම් හා තැන්පත් ගෙවීම් වන අතර හරස් සටහන් ලැබීම් හා ගෙවීම් ඉන් ඉවත් කොට ඇත. | විධිවිධාන ප්‍රකාරව සියලුම තැන්පතු ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වීම. |

1.6.6 **අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් (SA - 52) අනුව අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.49,783,896ක් ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.11,279,396ක් ACA - 5 අත්තිකාරම් ගිණුමේ එම අගය රු.11,279,774ක් විය. SA 52 අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි රු.38,504,500ක් අඩුවෙන් දක්වා තිබුණි. | රු. 38,504,500 ක වටිනාකමක් මාරු පත්‍ර මගින් බැර වී ඇත. | භාණ්ඩාගාර පොත් SA 52 අනුව අත්තිකාරම් ලැබීම්වල වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දැක්විය යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර පොත් (SA - 52) අනුව අත්තිකාරම් ගිණුමෙහි අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු.84,469,824ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම අගය රු.45,965,324ක් වුයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි රු.38,504,500ක් අඩුවෙන් දක්වා තිබුණි. | රු. 38,504,500 ක වටිනාකමක් මාරු පත්‍ර මගින් හර වී ඇත. | භාණ්ඩාගාර පොත් SA 52 අනුව අත්තිකාරම් ගෙවීම්වල වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දැක්විය යුතු වේ. |
| (ඇ) | අමාත්‍යාංශ ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් අයකර ගැනීම රු.66,181,985 ක් හා ගෙවීම් වටිනාකම රු.65,372,739ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේ අයකර ගැනීම රු.948,553ක්ද ගෙවීම රු.5,097,338 ක් ද වශයෙන් වුයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම් රු.65,233,432ක් ද අත්තිකාරම් ගෙවීම් රු.60,275,401ක් ද අඩුවෙන් දක්වා තිබුණි. | රු.66,181,985 යන අගය තුල 11 හා 12 යන කාණ්ඩ දෙකෙහිම ලැබීම් අන්තර්ගත වන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇති රු.948,553 තුළ11 කාණ්ඩය යටතේ මුදල් ලැබීම් පමණක් දක්වා ඇත. රු.65,372,739 යන අගය, 11 හා 12 යන කාණ්ඩ 2 වද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් පොතේ ශේෂය සත්‍ය වශයෙන්ම බලපෑම් කරනු ලබන 11 කාණ්ඩය යටතේ ලබාදී ඇති අත්තිකාරම් හා ණය වටිනාකම් වේ. | සියලුම අත්තිකාරම් අයකර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම්වල නිවැරදි වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගත යුතු වීම. |

1.6.7 **අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකම රු.4,441,287,445ක් ද මූල්‍ය ප්‍රකාශ තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එම අගය රු.7,291,269,303ක් ද ACA - 3 අග්‍රිම ගිණුම අනුව එම අගය රු.20,534,767,464ක් විය. | පළමු මාස 8 සඳහා රු.16,581,731,000 ක අග්‍රිමයක් භාණ්ඩාගාරයෙන් ලද අතර ඉන් රු.13,836,600,000 ක අත් මුදල් ශීර්ෂ අංක 162 හා 166 වෙත මුදා හැර ඇත. එමෙන්ම සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා රු.4,441,289,445.07 ක මුදලක් අග්‍රිම ලෙස භාණ්ඩාගාරයෙන් 415 ශීර්ෂයට ලබාදී ඇත. තවද 01.09.2020 සිට 415 ශීර්ෂයට ඒකාබද්ධ කරන ලද නැවත පදිංචි කිරීමේ අංශය වෙත වසර පුරාම ලද රු.261,187,746 අග්‍රිම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාණ්ඩාගාරයේ අග්‍රිම ලැබීම් ලෙස එකතු කොට දක්වා ඇත.<br><br>ACA 3 හි අග්‍රිම පිළියෙල කොට ඇත්තේ 397/20 අග්‍රිම ගිණුමට අදාලව හා මූල්‍ය ප්‍රකාශන 397/20 සහ 296/20 යන අග්‍රිම ගිණුම් දෙකම පාදක කොට ගෙනය. මෙය ලිපිකාරමය හෝ ගිනුම්කරණ හෝ දෝෂයක් නොවන අතර පසුගිය වර්ෂයේ සිදු වූ විශේෂ ශීර්ෂ මාරුවීම් හරහා සිදු වූ තාක්ෂණික කරුණු මත | ශීර්ෂ අංක 415ට අදාළ අග්‍රිම ලැබීම් වටිනාකම පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් යටතේ දැක්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | පැන නැගුණ ගැටළුවක් හේතුවෙන් එක් නිශ්චිත අගයකට විගණන විමසුමේ දක්වා ඇති අයිතමයන් පෙන්නුම් කළ නොහැක. | |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම මුදල වන රු.4,680,455,220ක මුදල, අග්‍රිම ලැබීම් ලෙස දැක්විය යුතු වුවත් දක්වා තිබූ මුදල රු.7,293,324,476කි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අග්‍රිම ලැබීම් ලෙස රු.2,612,869,256ක් වැඩියෙන් දක්වා තිබුණි. | සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලෙස රු.4,441,287,445.07 ක මුදලක් 415 ශීර්ෂයට ලබාදී ඇත. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් ලෙස දක්වා ඇත්තේ 123 ශීර්ෂයට එවකට අයත්ව තිබූ 397/20 අග්‍රිම ගිණුමට ජනවාරි සිට අගෝස්තු දක්වා ලද අග්‍රිමයත්, පසුව 415 ශීර්ෂයට අයත් 397/20 අග්‍රිම ගිණුමට සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලද අග්‍රිමයත් සහ නැවත පදිංචි කිරීමේ අංශයට ජනවාරි සිට අගෝස්තු දක්වා 296/20 අග්‍රිම ගිණුමට ලද අග්‍රිමයත් යන සියළුම අග්‍රිම ලැබීම් වල එකතුව වේ. | ශීර්ෂ 415 ට අදාළ අග්‍රිම මුදල පමණක් අග්‍රිම ලැබීම් ලෙස ගත යුතු වීම. |
| (ඇ) | අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමට අනුව භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම මුදල රු.235,874,291ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.500,000ක් ලෙස දක්වා තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.235,374,291ක් අඩුවෙන් දක්වා තිබුණි. | 397/20 අග්‍රිම ගිණුමට 162 හා 166 ශීර්ෂ මගින් 31.08.2020 දිනට පැවති නොපියවූ අග්‍රිම ශේෂය වන රු.235,874,291.44 ක මුදල CIGAS වැඩ සටහන මගින් පියවීමේදී දෙවරක් සටහන් වීම CIGAS වැඩ සටහන මගින් නිවැරදි කිරීමේදී සටහන් වනුයේ රු.235,874,291.44 භාණ්ඩාගාරයට මුදල් පියවීමක් ලෙසය. සත්‍ය වශයෙන් මුදල් ලෙස භාණ්ඩාගාරයට පියවන ලද්දේ රු.500,000/= ක මුදලක් පමණි. | අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාරයට පියවන ලද මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම මුදල ලෙස දැක්විය යුතු වේ. |

1.6.8 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය**<br>අමාත්‍යාංශයේ නිවාස අංශය විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පිළියෙල කළ යුතු හානි පිළිබඳ ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් ආයතන අංශය තුළ පවත්වාගෙන යනු ලබයි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **අග්‍රිම කළමනාකරණය**

අමාත්‍යාංශය අග්‍රිම ශේෂය සම්බන්ධයෙන් අනාවරණය වු නිරීක්ෂණ පහත සඳහන් පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් **SA - 10** අනුව භාණ්ඩාගාරය සෘජුව දරා ඇති වියදම රු.4,923,279,654ක් වන අතර, එම වටිනාකම ගෙවීම් ලෙස අක්මුදල් ගැළපුම් ගිණුමේ සඳහන් කළ යුතු වුවත් අක්මුදල් ගැළපුම් ගිණුමේ එම ප්‍රමාණය රු.3,759,902,246ක් වූයෙන් රු.1,163,377,408ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | අක්මුදල් ගැලපුම් ගිණුමේ 3,759,902,246 ක් ලෙස දක්වා ඇත්තේ 415 වැය ශීර්ෂයට අයත් වැය විෂයන් වලට අදාලව භාණ්ඩාගාරය සෘජුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට සහ CIDA ආයතනය වෙත නිදහස් කරන ලද අක්මුදල් වල වටිනාකම වේ. | 415 ශීර්ෂයට අදාළව භාණ්ඩාගාරය සෘජුව දරා ඇති වියදම්වල නිවැරදි වටිනාකම අක්මුදල් ගැළපුම් ගිණුමට ගැළපිය යුතු වේ. |
| (ආ) | අමාත්‍යාංශය වියදම් ශීර්ෂයෙන් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්වල වටිනාකම රු.4,169,941,425ක් වුවත්, අක්මුදල් ගැළපුම් ගිණුමෙහි එම වටිනාකම රු.5,869,105,165ක් වූයෙන් රු.1,699,163,740ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | **123** ශීර්ෂය යටතේ පැවති වැය විෂයන් 05ක් **2020** වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය වාර්තාවේ දක්වා ඇත්තේ 411 ශීර්ෂය යටතේය. ඒ අනුව ජනවාරි සිට | 415 ශීර්ෂයෙන් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්වල නිවැරදි වටිනාකම අක්මුදල් ගැළපුම් ගිණුමට ගැළපිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | අගෝස්තු දක්වා ඉහතින් සඳහන් කල වැය විෂයන් වලට අදාලව 397/20 අග්‍රිම ගිණුම යටතේ දරන ලද සියළු වියදම් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කර ඇත. | |
| (ඇ) | අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමට වඩා භාණ්ඩාගාර **SA** 52 හි අත්තිකාරම් ලැබීම් රු.16,398,089ක් අඩුවෙන්ද අත්තිකාරම් ගෙවීම් රු.19,097,085ක් වැඩියෙන්ද වූ වටිනාකම් අක්මුදල් ගැළපුම් ගිණුමට එකතු කළ යුතු වුවත්, අක්මුදල් ගැළපුම් ගිණුමෙහි අත්තිකාරම් ගෙවීම් ලෙස රු.40,867,985ක් එකතු කර තිබූ අතර අත්තිකාරම් ලැබීම් ලෙස රු.10,330,843 අඩුකර තිබුණි. | ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් දක්වා ඇති අගයන් තුළ අන්තර්ගත වනුයේ වසර තුළ විවිධ ශීර්ෂ මගින් හා ශීර්ෂයන් වලට මාරු පත්‍ර මගින් **415** ශීර්ෂය මගින් හා **415** ශීර්ෂය වෙත යොමු කරන ලද මාරු පත්‍ර වල මුළ අගයයි. මෙය ශේෂය මාරු කරනු ලබන අවස්ථාවේ පවතින ශේෂය මිස වසර අග වන විට ඇති ශේෂය නොවේ. | භාණ්ඩාගාර SA 52 හා අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අතර අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වටිනාකම්වල වෙනස අක්මුදල් ගැළපුම් ගිණුමට ගැළපිය යුතු වේ. |
| (ඈ) | අමාත්‍යාංශ ශේෂ පිරික්සුමට වඩා භාණ්ඩාගාර SA - 30 හි වැඩියෙන් සටහන් වී ඇති රු.11,605,786ක්වූ තැන්පතු ලැබීම් අක්මුදල් ගැළපුම් ගිණුමෙන් අඩු කළ යුතු අතර රු.2,451,886ක්වූ වැඩියෙන් සටහන් වී ඇති තැන්පතු ගෙවීම් අක්මුදල් ගැළපුම් ගිණුමට එකතු කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් සකස් කර තිබූ අක්මුදල් ගැළපුම් ගිණුමෙහි තැන්පතු ලෙස රු.9,585,415ක මුදලක් අඩු කිරීම් වශයෙන් පමණක් සටහන් කර තිබුණි. | **2020** වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ශීර්ෂ මාරුව හේතුවෙන් ශේෂ පිරික්සුම කොටස් දෙකකින් සමන්විත වේ. එනම් ජනවාරි සිට අගෝස්තු දක්වා එක් කොටසක්ද සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා තව කොටසක්ද ලෙස ශේෂ පිරික්සුම සමන්විත වේ. ඔබ විසින් විගණන විමසුමෙහි අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් ලෙස දක්වා ඇත්තේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ ශේෂ පිරික්සුමේ අගයන් පමණි. ජනවාරි සිට අගෝස්තු දක්වා වූ අගයන්ද විගණන විමසුමේ දක්වා ඇති අගයන්ට එකතුවිය යුතුය. | භාණ්ඩාගාර SA - 30 හා අමාත්‍යාංශ ශීර්ෂයට අදාළ ශේෂ පිරික්සුම අතර තැන්පතු ලැබීම් හා ගෙවීම් වටිනාකම්වල වෙනස අක්මුදල් ගැළපුම් ගිණුමට ගැළපිය යුතු වේ. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී වියදම් නිශ්චිතව හා පැහැදිලිව හඳුනා නොගැනීම නිසා වැය විෂයයන් 10 සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.22,195,000 ක ප්‍රතිපාදන මුදලින් කිසිදු වියදමක් වර්ෂය තුළ දරා නොතිබුණු අතර තවත් වැය විෂයයන් 13ක අවශ්‍යතාවයන්ට වඩා සියයට 52 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | අමාත්‍ය මණ්ඩල කාර්යාල කටයුතු මාස 06ක කාලසීමාවකට පමණක් ක්‍රියාත්මක වීම.<br>Covid - 19 තත්ත්වය, 2019 නොවැම්බර් 19 දිනැති ව්‍යාපෘති චක්‍රලේඛය මගින් විදේශ ගමන් වියදම් අත්හිටුවීම.<br>නැවත පදිංචි කිරීමේ අංශය වසර පුරා ගොඩනැගිලි කිහිපයක් මාරු වීම නිසා වියදම් පැන නොගැනීම ගොඩනැගිලි කුලී ගිවිසුම 2020 පෙබරවාරි අවසන් වීම. | වියදම් පැහැදිලිව හඳුනා ගෙන අවශ්‍යතාවලට අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතු වේ. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තු සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර වැය විෂයයන් 05 කට අදාලව සියයට (සෘණ) - 549 ත් සියයට 100 අතර අසාමාන්‍ය විචලතාවයන් නිරීක්ෂණය විය. | කොවිඩ් 19 තත්වය හේතුවෙන් සියලුම කාර්ය මණ්ඩල සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම,<br>අවසන් මාස 04 ක කාල සීමාව සඳහා අමාත්‍ය කාර්ය මණ්ඩලය රාජකාරි කටයුතු සිදු කිරීම,<br>විදෙස් ගමන් අත්හිටුවීම,<br>අමාත්‍යංශය වෙනස් වීම හරහා අප අමාත්‍යාංශය හරහාම කාර්යසාධන වාර්තාව මුද්‍රණය කිරීමට සිදුවීම මගින් ඇස්තමේන්තු කල ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන අවශ්‍ය විය. | අසාමාන්‍ය විචලතා ඇති නොවන ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 07 ක් සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 84 ත් සියයට 550 ක් අතර ප්‍රමාණයකින් මු.රෙ.66 මගින් ප්‍රතිපාදන මාරු කර තිබූ අතර එම වැය විෂයන් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සැලසීම | ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් විදෙස් ගමන් අත්හිටුවීම.<br>අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කරන ලද කණිෂ්ඨ සේවකයින් අඩු කිරීම.ෙ | වියදම් පැහැදිලිව හඳුනාගෙන අවශ්‍යතාවට අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| තාත්වික නොවන බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 තත්වය හේතුවෙන් සියලුම කාර්ය මණ්ඩල සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.<br>අවසන් මාස 04 ක කාල සීමාව සඳහා අමාත්‍ය කාර්ය මණ්ඩලය රාජකාරි කටයුතු සිදු කිරීම.<br>අමාත්‍ය කාර්යාලය මාස 05 ක් ක්‍රියාත්මක නොවීම.<br>නව කාර්ය සාධන වාර්තාව මුද්‍රණය කිරීම හේතු විය. | |

## 2.3 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය සඳහා භාණ්ඩාගාරයේ අග්‍රිම ලැබීම හා පියවීම එවකට තිබුණු අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් අංකය යටතේ සිදු කර තිබුණි. එම අග්‍රිම ගිණුම් අංකය යටතේ භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.මිලියන 21,341ක් ලෙස භාණ්ඩාගාර අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණත්, මෙම අමාත්‍යාංශයේ කටයුතු 2020 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වූ බැවින් එදින සිට වර්ෂය අවසානය දක්වා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලෙස රු.මිලියන 4,444ක් ලැබී තිබුණි. ඉන් රු.500,000ක් 2020 දෙසැම්බර් 31 දින මුදලින් භාණ්ඩාගාරයට පියවා තිබුණි. | අප අමාත්‍යාංශය 2020 වර්ෂය තුළ ශීර්ෂ අංක 02 ක් යටතේ හා තනි අග්‍රිම ගිණුමක් යටතේ කටයුතු කරන ලදී. ඒ අනුව 123 ශීර්ෂයට එවකට අයත් 397/20 අග්‍රිම ගිණුමට ලද භාණ්ඩාගාර අග්‍රිමද 415 ශීර්ෂයට අදාලව සැප්තැම්බර් සිට අයත් 397/20 අග්‍රිම ගිණුමට ලද භාණ්ඩාගාර අග්‍රිමද රු මිලියන 21,341 තුළ අන්තර්ගත වේ. එයට අමතරව භාණ්ඩාගාරය විසින් වැරදීමකින් 397/20 අග්‍රිම ගිණුමට කරන ලද රු මිලියන 144 හර සටහනද 397/20 අග්‍රිම ගිණුම වෙත මුල් මාස 08 දී 166 ශීර්ෂය වෙනුවෙන් ලද රු මිලියන 153 ක අග්‍රිමද රු මිලියන 21,341 තුළ අන්තර්ගත වේ.<br>මේ පිළිබඳව ACA 3 ආකෘතියේ පාද සටහන් වල හෙළි දරව් කිරීම සිදු කොට ඇත. | මෙම අමාත්‍යාංශ ශීර්ෂයට අදාළ අග්‍රිම ලැබීම් පමණක් ගිණුම්වලට ගත යුතු වීම. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වසරේදී අතපසුවීමකින් අදාල සහතිකය ලබා දීමට නොහැකි වුවත් 2021 වසරේදී මෙය ලබා දීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>(i) 2/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛය 1 පරිච්ඡේදය | සේවයේ නියුක්ත සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදු | පෙර වසර වලදී කාර්ය සාධන ගිවිසුම අත්සන් කර නොතිබීම පිළිගන්නා අතර 2021 වසර සඳහා ඒ ඒ අංශවල නිලධාරීන්ගේ | සේවයේ නියුක්ත සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | කළ යුතු වුවත් එවැනි කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | කාර්ය සාධන ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | |
| | (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම සිදු කර නොතිබුණි. | 2020 වර්ෂය තුළදී අමාත්‍යාංශය සතුව පවතින වාහන 18 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇති අතර පැවති කොවිඩ් වසංගත තත්ත්වය තුල සියළු වාහන වල ඉන්ධන පරීක්ෂාව සිදු කර අවසන් කිරීමට නොහැකි විය. | සියලුම වාහනවල ඉන්ධන දහනය වීම් පරීක්ෂා කළ යුතු වේ. |
| | (iii) 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛ අංක 05/2008 (I) | පුරවැසි / සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වා දීම පිළිබඳ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | පුරවැසිලාභී ප්‍රඥප්තිය යාවත්කාලීන කිරීම සඳහා 2020 වර්ෂයේදී කටයුතු ආරම්භ කළද 2020 වසර අගවන විට මෙම අමාත්‍යාංශයට නැවත පදිංචි කිරීමේ අංශයද සම්බන්ධ වීම හේතුවෙන් එම අංශය නිසි පරිදි මෙම අමාත්‍යාංශයේ ස්ථාපිත කරන තෙක් අදාල කටයුතු නතර කරන ලදි.මේ වන විට එම අංශයේද තොරතුරු ලබාගෙන ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දී ඒ අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2019 නොවැම්බර් 28 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මු.රෙ. 880 යටතේ ඇප තැබිය යුතු රජයේ නිලධාරින් ඇප තබා නොතිබුණි. | ඇප තැබීමේ කටයුතු ආරම්භකර අදාල ආකෘති පත්‍ර සම්පූර්ණ කර කටයුතු ආරම්භ කර තිබුණද පවත්නා තත්ත්වය අනුව ඇප මුදල් වැටුපෙන් අය කිරීම ආරම්භ කිරීම කළ නොහැකි විය. | මු.රෙ. 880 යටතේ ඇප තැබිය යුතු නිලධාරින් ඇප තැබිය යුතු වේ. |

**2.6 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනමකට ලක්වී තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.99,460 ක ණය ශේෂය වර්ෂ 4-5 දක්වා වුවද කාල විශ්ලේෂණය අනුව වර්ෂ 1-2 දක්වා ලෙස සටහන් කර තිබූ අතර, තවත් නිලධාරියෙකුගේ රු.117,690ක මුදල වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි. | අයවිය යුතු රු.99,460/= ක ණය ශේෂය රු.5,000.00 බැගින් මාසිකව එම්.පී.ප්‍රයිස් මහතාගේ බිරිද විසින් ගෙවීම් සිදු කරනු ලබයි.<br><br>2010 වර්ෂයේදී වැඩ තහනමකට ලක්වී ඇති නිලධාරිනියට අදාල ණය ශේෂය වූ රු.117,690 ක මුදල ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | අයවිය යුතු ණය ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට ක්‍රියා කළ යුතු අතර එම ණය ශේෂවලට අදාළ කාලවිශ්ලේෂණ නිවැරදිව සකස් කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය තුළ නිවාසලාභීන් සඳහා නිවාස ඔප්පු 1,000ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය තුළ ඔප්පු කිසිවක් නිකුත් කර නොතිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ආයතන දිගින් දිගටම වසා තැබීම නිසා සේවකයින් සේවයට නොපැමිණීමේ හේතුවෙන් මෙම තත්ත්වය උදා වී ඇත. | සැලසුම්ගත කාර්යයන් ඉටු කිරීමට ක්‍රියා කළ යුතු වේ. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැවත පදිංචි කිරීමේ අංශය මගින් ක්‍රියාත්මක කර තිබූ තෝරා ගත් කුඩා කර්මාන්තකරුවන්ට අනුග්‍රහය දැක්වීම සඳහා 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 104ක ඇස්තමේන්තු මුදලක් වෙන්කර තිබූ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 21ක් වුවද, ව්‍යාපෘතිය මේ වන විට අත්හැර දමා තිබුණි. වර්ෂයේ කර්මාන්ත 49ක් සඳහා අනුග්‍රහය දැක්වීමට ඉලක්කගත කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව ලබා තිබූ භෞතික ප්‍රගතිය සියයට 1ක් පමණක් විය. | මෙම අතැති බිල්පත් පියවීම වෙනුවෙන් රු.මිලියන 104 ක ප්‍රතිපාදනය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට නිදහස් කර ඇතත් රටතුළ පවත්නා Covid - 19 තත්ත්වය මත කාලය ප්‍රමාණවත් වී නොමැති අතර මේ සඳහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලැබී නොමැත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තත්ත්වයේ පවතින ව්‍යාපෘතියක් නොවන බැවින් නැවත පදිංචි කිරීමේ අංශයේ 3 වන අතුරු සම්මත ගිනුමෙන් මෙය ඉවත් කර ඇත. | මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතියේ ලබා ගත යුතු අතර, අදාළ කාර්යය ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඔබට ගෙයක් රටට හෙටක් නිවාස වැඩසටහන (නව) ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන රුපියල් මිලියන 5,272න් මූල්‍ය ප්‍රගතිය සියයට 90ක් වුවද, වර්ෂයේ ඉලක්කගත නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව වූ නිවාස 5,000න් නිමකර තිබූ නිවාස සංඛ්‍යාව 3,950කි. ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 79කි. | ඔබට ගෙයක් රටට හෙටක් නිවාස වැඩසටහන ( නව) සහ ඔබට ගෙයක් රටට හෙටක් නිවාස වැඩ සටහන (අවිච්ජේද) යන වැඩ සටහන් දෙකටම මුදල් ලබා දෙයි. මෙම ණය ආධාර යටතේ දෙනු ලබන මුදල වියදම් කර නිවසක් ඉදි කිරීම සඳහා නිවාස ලාභීන්ගේ විශාල ශ්‍රම දායකත්වයක් බලාපොරොත්තු වේ. රටේ | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතියද ලබාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | පැවති වසංගත රෝග තත්ත්වය තුළ නිවාස ලාභීන්ගේ සේවය ලබා ගැනීමට අපහසු වීම මත බොහෝ නිවාස ඉදිකිරීම ප්‍රමාද වූ බැව් දන්වමි.එම නිසා භෞතික ප්‍රගතිය අඩු වී ඇති බව කාරුණිකව සලකන්න. | |
| **(ආ)** | ඔබට ගෙයක් රටට හෙටක් නිවාස වැඩසටහන (අවිච්ඡේද) මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රුපියල් මිලියන 810ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 70ක් හා නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව වූ නිවාස 2,500න් නිවාස නිමකිරීම 500ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 20ක් පමණි. | -එම- | -එම- |
| (ඇ) | ශාන්ති ආරච්චිවත්ත නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රුපියල් මිලියන 15ක් වුවත් වර්ෂය තුළ කිසිඳු වියදමක් දරා නොතිබුණි. එහෙත් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ලෙස සියයට 7ක ලෙස පෙන්නුම් කර තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් කරුණට එකඟ වන අතර 2021 වර්ෂයේදී මෙම නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කරමි. | නියමිත කාලය තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතු වේ. |

## 3.4 විදේශ ආධාර ව්‍යාපෘති

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉන්දියන් ආධාර යටතේ ක්‍රියාත්මක වන පූජා මාදුළුවාවේ සෝභිත නාහිමි නිවාස ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණද මේ වන විට එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නතර වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරා ඇති වියදම රුපියල් මිලියන 47ක් බවද භෞතික ප්‍රගතිය සියයට 30 බවද අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතිය පැවරූ ආයතනය ව්‍යාපෘති කොන්දේසි කඩ කිරීමේ හේතුවෙන් ඔවුන් විසින් ඉදිරිපත් කර තිබූ කාර්ය සාධන ඇපකරය අවලංගු කරනු ලැබූ අතර එහි වටිනාකම ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය විසින් අය කර ගෙන ඇත. මේ වන විට මෙම ව්‍යාපෘතිය මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය හරහා සිදු කිරීමට කටයුතු යොදා ඇත | ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වේ. |
| (ආ) ඉන්දියන් ආධාර යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති 04හි අමාත්‍යාංශ ප්‍රගති වාර්තා අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට ප්‍රගතිය පහත පරිදි විය | විගණනයෙන් දක්වා ඇති කරුණු වලට එකඟ වෙමි. පසු ගිය වසංගත තත්ත්වය තුළ නිවාස ලාභීන්ට නිවාස ඉදිකිරීම සඳහා මුදල් වැය කිරීමට අපහසු වූ බැවින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් කරනු ලැබූ ප්‍රතිපූර්ණය කිරීම් නිසි අයුරින් සිදු නොවිනි. මේ පිළිබඳව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමග කරනු ලැබූ සාකච්ඡාවට අනුව වාරික මුදල් ප්‍රතිපූර්ණය කරනවා වෙනුවට කලින් ලබාදීම සඳහා ගිවිසුම | ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වේ. |

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාල සීමාව | ව්‍යාපෘති මූල්‍ය වටිනාකම රු. මිලියන | දරා ඇති වියදම රු. මිලියන | වැඩ ආරම්භ කර ඇති නිවාස ගණන | නිම කර ඇති නිවාස ඒකක ගණන |
|---|---|---|---|---|---|
| දිප ව්‍යාප්ත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | 2017-2020 | 300 | 246 | 458 | 258 |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය I | 2017-2020 | 300 | 148 | 606 | 13 |
| උතුරු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | 2018-2021 | 300 | 60 | 278 | 09 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය II | 2018-2021 | 300 | 44 | 519 | - | සංශෝධනය කරන ලදි. ඒ අනුව නිවාස ආධාර මුදල් වාරික වශයෙන් නිවාස ලාභීන්ට ලබා දීමට කටයුතු කරන අතර ඒ අනුව මෙම ප්‍රමාදයන් බොහෝ විට අවම වනු ඇත. |

මේ අනුව වර්ෂ 03කට අධික කාලයක් ගතවී තිබුණත් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සතු වාහන 09ක් ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයට ලබාගෙන ඇති අතර මෙම වාහන මෙතෙක් මෙම අමාත්‍යාංශයට භාර දී නොතිබුණි. | වාහන 05ක් මෙම අංශය වෙත නැවත ලැබී ඇත. ඉතිරි වාහන 09 ද කඩිනමින් ලබාගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | මෙම වාහන අමාත්‍යාංශයට නැවත ලබා ගත යුතු වේ. |
| (ආ) | මහා භාණ්ඩාගාරය හරහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් PD 9553 සහ KX 7872 අංක දරන වාහනවල කල්බදු කාලය අවසන් වී ඇතත් මෙතෙක් අමාත්‍යාංශයට පවරා ගෙන නොතිබුණි. | PD - 9553 අංක දරණ රථය කොම්ටෝලර් ජනරාල් කාර්යාලයෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරන බවද KX-7822 අංක දරණ රථයද ඉදිරියේදී පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව ද කාරුණිකව දන්වමි. | මෙම වාහන කඩිනමින් අමාත්‍යාංශයට පවරා ගත යුතු වේ. |

**3.6** **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 ජුනි 12 දින අනතුරට පත් වී ඇති JN 3634 රථය සඳහා රියදුරුගෙන් අයවීමට ඇති රු.49,982ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | නිලධාරියාගෙන් අයවිය යුතු මුදල වන රු.54,981.95 ක මුදලින් රු.5,000/=ක් අයකර ගෙන ඇති බවත් ඉතිරි මුදල මාසික වාරික 10කින් ගෙවීම් කරන බවත් එම නිලධාරියා විසින් දැනුම්දී ඇත. | රියදුරුගෙන් අයකරගත යුතු මුදල අයකර ගත යුතු වේ. |
| (ආ) 2019 ජනවාරි 09 දින හානියට පත්වී ඇති CAF 2192 වාහන සඳහා අයකර ගත යුතු රු.7,055ක මුදල අයකර නොතිබුණි. | මු.රෙ.104(4) යටතේ අවසන් පරීක්ෂණය සිදුවෙමින් පවතින අතර පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් අනතුරුව අදාල රු.7,055.00ක මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව. | අයකර ගත යුතු මුදල අයකර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. |
| (ඇ) 2019 මාර්තු 19 දින අනතුරට පත්වී ඇති KR - 5428 රථයට අදාළ අයකර ගත යුතු රු.9,049 මුදල අයකර නොතිබුණි. | මු.රෙ.104(4) යටතේ අවසන් පරීක්ෂණය සිදු කර අවසන් නොමැති අතර පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසු අදාල රු.9,049.00 මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අයකර ගත යුතු මුදල අයකර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. |

**3.7** **කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 අයවැය යෝජනාවට අනුව 1972 අංක 07 දරන ගෙවල් කුළී පනත මෙතෙක් සංශෝධනය කර නොතිබුණි. | පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා නිවාස කොමසාරිස් වරුන් වෙතින් මේ සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ගෙන්වා ගෙන මෙහි ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මෙම පනත කඩිනමින් සංශෝධනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2020 දෙසැම්බර් 31 දින දක්වා රාජ්‍ය ආයතනවලින් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීමට එවා තිබූ කොන්ත්‍රාත් 38ක් සඳහා 2020 වර්ෂය අවසාන වන විටත් ඇගයීම් කර අනුමැතිය ලබා දී නොතිබුණි. | අනුමැතිය ලබා දිය යුතු ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතීන් ලබා දීම් ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු වේ. |
| (ඇ) නිවාස යෝජනා ක්‍රම යටතේ නිවාස ඉදිකර ඇති පෞද්ගලික ඉඩම් 64 ක සංඛ්‍යාවක් මුදල් ගෙවා පවරා ගත යුතු වන අතර 2019 වර්ෂයේ ඉඩම් 08 ක් සඳහා වන්දි ගෙවා තිබුණි. තවදුරටත් වන්දි ගෙවා පවරා ගැනීමට ඉඩම් 56 ක ප්‍රමාණයක් පැවතුණි. | **2020** වර්ෂය අවසාන වන විට ප්‍රාදේශිය ලේකම් වරුන් විසින් වන්දි හා වන්දි පොලී දක්වා ඇති සංඛ්‍යාව **15** ක් වන අතර කඩිනමින් මෙම වන්දි හා පොලී ලෙවා ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා කටයුතු කරමි. | අදාළ පාර්ශවයන්ට වන්දි ගෙවා කඩිනමින් ඉඩම් පවරා ගත යුතු වේ. |
| (ඈ) රජයේ කර්මාන්තශාලාව ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් පත්කල විද්වත් කමිටු වාර්තාව 2020 වර්ෂයේ අවසාන වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වන අතර අදාල වාර්තාව කඩිනමින් ලබා දීමට කටයුතු කරමි. | විද්වත් කමිටු වාර්තාව ලබා ගැනීමට කටයුතු කර එම වාර්තාවේ නිර්දේශයන් අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කළ යුතු වේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධන ජාතික සභාවේ නිරීක්ෂණ හා උපදෙස් හා යෝජනා අනුව තිරසර සංවර්ධන සැලැස්ම සංශෝධනය කර සකස් කර තිරසර සංවර්ධන ජාතික සභාවට ඉදිරිපත් කර නොතිබුණි. | කඩිනමින් සංශෝධිත සැලැස්ම තිරසර සංවර්ධන ජාතික සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | තිරසර සංවර්ධන ජාතික සභාවේ නිරීක්ෂණ හා උපදෙස් පරිදි තිරසාර සංවර්ධන සැලැස්ම සකස් කර අනුමත කර ගත යුතු වේ. |

**5.** **යහපාලනය**

**--------------**

**5.1** **මහජනයා වෙත සේවා ඉටු කිරීම**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වන්දි මුදල ඉල්ලුම් කර ඇති ඉඩම් මීට වසර 20කට පෙර අත්පත් කර ගෙන නිවාස ඉදිකර ඇති බව නිරීක්ෂණය වන අතර, අදාළ ඉඩම් හිමියන්ට වන්දි මුදල් ගෙවා නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේදී ඉතා දිගු ක්‍රමවේදයක් හා කාලයක් ගතවීම ඉඩම් හිමියන්ට වන්දි මුදල් ලබා දීමේදී ප්‍රමාද වීමට බෙහෙවින් බලපානු ඇත. මෙම තත්ත්වයන් අමාත්‍යාංශයේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉතාමත් හොඳින් දැන සිටින අතර පවරා ගන්නා ඉඩම් වලට වන්දි ලබා දී අළුත් නිවාස ලාභීන් සඳහා ඔප්පු ලබා දීම සඳහා වේගවත්ව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | වන්දි මුදල් ඉල්ලුම්කර ඇති විට ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ගෙවිය යුතු වේ. |
| (ආ) | පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණද එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා නොදීම හේතුවෙන් නිවාසවල නීත්‍යානුකූල අයිතිය ලැබී නොතිබුණි. | -එම- | පදිංචි නිවාසලාභීන්ට ඔප්පු ලබා දීමට කටයුතු කළ යුතු වේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 343ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 263ක් විය. ඒ අනුව පුරප්පාඩු පවතින තනතුරු 80ක් පිරවීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩු 80 පුරවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, පරිපාලන සේවා අංශය, ඉංජිනේරු සේවා අංශය, ක්‍රම සම්පාදන අංශය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, බහුකාර්ය සංවර්ධන කාර්යය සාධන බලකාය යනාදී අංශ වලට වරින් වර ලිපි ඉදිරිපත් කර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |